JMC vLearning
"your virtual learning partner"

# රක්ෂණ, කල්බදු සහ කුළීපිට ගැනුම්, ණය නීති

## AAT අදියර II

ප්‍රභාත් විජේසිරි
LL.B, Attorney at Law

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# රක්ෂණ නීතිය, මූල්‍ය කල්බදු,කුලී සින්නක්කර සහ ණය පිලිබඳ නීතිය

## විෂය නිර්දේශය මත බර තැබීම - 10 %

## රක්ෂණ නීතිය - පාඩම් අන්තර්ගතය

- I රක්ෂණ නීතිය හැඳින්වීම
- I රක්ෂණ වර්ගීකරණය
- I ජීවිත රක්ෂණය හා සහතික වීම්
- I සාමාන්‍ය රක්ෂණ
- I සාමුද්‍රික රක්ෂණ
- I රක්ෂණ හිමිකම
- I උපරිම විශ්වාසය පිලිබඳ මූලධර්මය
- I රක්ෂණ ඔප්පුවක් පැවරීම

JMC vLearning
"your virtual learning partner"

සැකසුම - කේ.ඩී. ප්‍රභාත් විජයසිරි **( LLB , AAL )**

# <u>රක්ෂණ නීතිය හැඳින්වීම</u>

**රක්ෂණය යන්නෙහි සරල වචනාර්ථය රැකවරණය හෝ ආරක්ෂාව යන්නයි. රක්ෂණයක් ලබා ගැනීමේදී සිදු වන්නේ යම් කාරණාවකට අදාලව ආරක්ෂාව මිලදී ගැනීමකි. එනම් රක්ෂණ ගිවිසුමකදී සිදුවන්නේ රක්ෂිතයා නමින් හැඳින්වෙන පුද්ගලයෙකුට දරන්නට සිදුවන අවදානමක් , යම් මුදලක් ගෙවීමෙන් එම අවදානමේ වගකීම භාර ගැනීමට සූදානමින් සිටින රක්ෂකයා නමින් හැඳින්වෙන පුද්ගලයෙකු වෙත පැවරීමයි.**

⇨ **<u>රක්ෂකයා යනු</u>** යම් ප්‍රතිෂ්ඨාවක් යටතේ යම් අවදානමක් සඳහා වන්දි ගෙවීමට භාර ගන්නා පාර්ශවයයි. ( එනම්, රක්ෂණාවරණයක් සපයන පාර්ශවයයි. )

⇨ **<u>රක්ෂිතයා යනු</u>** රක්ෂණ ගිවිසුමක් යටතේ රක්ෂණයක් ලබන අයයි.

⇨ **<u>රක්ෂණ ගිවිසුම යනු</u>** රක්ෂිතයා සහ රක්ෂකයා අතර ඇති වන ගිවිසුමයි.

**●● ඒ අනුව රක්ෂණ ගිවිසුමක් යනු වඩාත් පුලුල් අර්ථයෙන් ගත් කල "යම්කිසි ගෙවීමක් සැලකිල්ලට ගෙන රක්ෂිතයාට දැරීමට සිදුවන අවදානමක් රක්ෂකයා විසින් භාර ගැනීමට එකඟ වෙමින් එම දෙපාර්ශවය අතර ඇති වන ගිවිසුමකි. ●●**

රක්ෂණය යනු නිවාරණයක් නොව පිලියමකි. ඉන් අදහස් වන්නේ යම්කිසි දේපලක් රක්ෂණය කල පමණින් එම දේපලට හානි සිදුවීම වැලැක්වීමක් සිදුනොවන අතර, එහිදී සිදුවන්නේ එම දේපලට යම් හානියක් සිදු වුවහොත් අදාල රක්ෂණාවර,නය ප්‍රකාරව වන්දි ගෙවීම / හානි පූර්ණය කිරීම පමණකි.

☒ මෙරටදී **ජීවිත රක්ෂණය, ගිනි රක්ෂණය සහ නාවික ( සාමුද්‍රික ) රක්ෂණය සම්බන්ධයෙන් ඉංග්‍රීසි නීතිය** අදාල අතර **හදිසි අනතුරු රක්ෂණය සම්බන්ධයෙන් රෝම ලන්දේසි නීතිය** අදාල වේ. එහෙත් රක්ෂණයට අදාල යම් කාරණාවක් සම්බන්ධයෙන් රෝම ලන්දේසි නීතිය අපැහැදිලි නම්, එවිට ඉංග්‍රීසි නීතිය යොදා ගනී.

☒ තවද 2000 අංක 43 දරණ රක්ෂණ ව්‍යාපාර රෙගුලාසිය සහ එහි සංශෝධනයන් තුල රක්ෂණ ගිවිසුම් පාලනය වන ප්‍රතිපාදනයන් පිලිබඳව අන්තර්ගත වේ. ☒

**<u>රක්ෂණ ගිවිසුමක මූලිකාංග</u>**

🕮 නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ චේතනාව

🕮 අර්පනය ( රක්ෂණ යෝජනාව )

🕮 ප්‍රතිග්‍රහණය

🕮 නෛතික බව

🕮 පාර්ශවයන්ගේ ගිවිසුම් ශක්නුතාවය

🕮 ප්‍රතිශ්ඨාව

💣💣 යම් දේපලක් සම්බන්ධයෙන් රක්ෂණාවරණයක් ලබා ගැනීමේදී අදාල සිදුවීම පිලිබඳව යම් අවිනිශ්චිත බවක් තිබිය යුතුය. එනම්, යම් නිශ්චිත සිදුවීමක් සිදුවීමේ යම් ප්‍රමාණයක අවිනිශ්චිතභාවයක් තිබිය යුතුය. උදා - වාහනයක් හදිසි අනතුරකට පත්වීම, යම් දේපලකට සොර සතුරු උවදුරු, කාලගුණික උවදුරු සිදුවීම.

☒ එසේනම්., ජීවිත රක්ෂණයක්, වලංගු රක්ෂණයක් වන්නේද ?

ඔව්. ඊට හේතුව වන්නේ ජීවිත රක්ෂණයක් ලබා ගත් අයෙකු කෙදිනක හෝ මියයාම අනිවාර්යයෙන්ම සිදු වන නමුත් එම මරණය සිදු වන දිනය, අවස්ථාව අවිනිශ්චිත වීමයි.

## <u>රක්ෂණ ගිවිසුමක පාර්ශවයන්</u>

☺ පලමු පක්ෂය  හෙවත් රක්ෂණ යෝජනාව ඉදිරිපත් කරන පාර්ශවය ( රක්ෂිතයා )

☺ දෙවන පක්ෂය හෙවත් රක්ෂණ යෝජනාව ප්‍රතිග්‍රහණය කරන පාර්ශවය ( රක්ෂකයා )

☺ තුන්වන පක්ෂය - පලමු හා දෙවන පක්ෂය හැර ගිවිසුමේ ක්‍රියාකාරීත්වය අනුව ගිවිසුමට සම්බන්ධ වන පාර්ශවය වේ.

## <u>රක්ෂණ යෝජනාවක අන්තර්ගත විය යුතු කරුණු</u>

- යෝජිත  රක්ෂිතයා පිලිබඳ විස්තර
- අයිතීන් පිලිබඳ විස්තර
- අදාල අවදානමට බලපානු ලබන සංසිද්ධීන්
- යෝජිත රක්ෂිතයාගේ පෙර ඉතිහාසය
- ප්‍රතිශ්ඨාව
- වගකීමෙන් මුක්ත කරන වගන්තීන්
- රක්ෂණ ඔප්පුව වලංගු වන කාලසීමාව

## <u>ආවරණ ලිපිය</u>

රක්ෂණ යෝජනාව රක්ෂකයා විසින් ක්ෂණිකවම පිලි නොගන්නා බැවින් පලමුව රක්ෂකයා විසින් ආවරණ ලිපියක් නිකුත් කරනු ලැබේ. එම ආවරණ ලිපිය වලංගු වන්නේ රක්ෂණ යෝජනාව ප්‍රතිග්‍රහණය කරන තෙක් පමණි. ආවරණ ලිපිය වලංගු කාලසීමාව තුලදී රක්ෂිත දේපලට යම් අලාභයක් සිදු වුවහොත් එහි සඳහන් නියමයන්ට අනුව වන්දි ගෙවනු ලැබේ.

JMC vLearning "your virtual learning partner"

💣💣 පරදු ගිවිසුමක් යනු සූදුව, ඔට්ටු ඇල්ලීම හෝ තවත් ස්වරූපයක අවදානමක් සහිත ගිවිසුමකි.

රක්ෂණ ගිවිසුමක්ද යනු එක්තරා ස්වරූපයක අවදානමක් සහිත ගිවිසුමකි.

**රක්ෂණ ගිවිසුමක් සහ ඔට්ටු ගිවිසුමක් අතර වෙනස්කම්**

| රක්ෂණ ගිවිසුම | ඔට්ටු ගිවිසුම |
| --- | --- |
| • යමෙකු රක්ෂණ ගිවිසුමකට එලඹෙන්නේ ලාභයක් හෝ වාසියක් අපේක්ෂාවෙන් නොවේ. | • යමෙකු පරදු ගිවිසුමකට එලඹෙන්නේ ලාභයක් හෝ වාසියක් අපේක්ෂාවෙනි. |
| • රක්ෂිතයාට විෂය වස්තුව පිළිබඳව රක්ෂණ හිමිකමක් තිබිය යුතුමය. | • ඕනෑම දෙයක් සම්බන්ධයෙන් ඔට්ටු ඇල්ලීම සිදු කල හැකිය. |
| • සාමාන්‍යයෙන් එකම විෂය වස්තුවක් හෝ එකම කාරණාවක් සම්බන්ධයෙන් රක්ෂකයන් කිහිපදෙනෙක් ලඟ රක්ෂණය කල නොහැකිය. | • එකම කාරණාවක් සම්බන්ධයෙන් බුකි - - කරුවන් කිහිපදෙනෙක් ලඟ ඔට්ටු ඇල්ලීමට හැකිය. |
| • නීතිය ඉදිරියේ බලාත්මතක කල හැකිය. | • සමහර විට නීතිය ඉදිරියේ බලාත්මක කල නොහැකිය. |

## <u>ප්‍රධාන රක්ෂණ වර්ග</u>

හානිපූර්ණ රක්ෂණය සහ සම්භාව්‍ය ( අහඹු ) රක්ෂණය ලෙස ප්‍රධාන රක්ෂණ වර්ග දෙකකි.

1) **<u>හානිපූර්ණ රක්ෂණය ( INDEMNITY INSURANCE )</u>**

මෙම වර්ගයේ රක්ෂණ ගිවිසුම් වලදී සිදු වන්නේ සිදුවූ හානියක් පිරවීමක් හෙවත් හානිපූර්ණයකි. රක්ෂණ ඔප්පුවේ සඳහන් වටිනාකම, සිදුවී ඇති හානියේ ප්‍රමාණය ආදී කරුණු මත රක්ෂිතයාට හිමි වන වන්දි ප්‍රමාණය තීරණය කෙරේ. උදා - නිවසක් ගිනි ගැනීමකදී සිදුවන පාඩුව, ගිනි රක්ෂණ ඔප්පුවක් මගින් තීරණය කෙරේ.

2) **<u>සම්භාව්‍ය රක්ෂණය ( අහඹු රක්ෂණය ) ( CONTINGENCY INSURANCE )</u>**

**මෙම වර්ගයේ රක්ෂණ ගිවිසුම් වලදී හානිපූර්ණය කිරීමක් සිදු නොවන අතර යම් අහඹු සිදුවීමකදී මුදල් ගෙවීමක් මෙහිදී සිදුකෙරේ. ගෙවනු ලබන මුදල් ප්‍රමාණය රක්ෂණ ඔප්පුවේ සඳහන් වන අතර එය සිදුවූ හානියේ ප්‍රමාණය මත තීරණය නොවේ.**

උදා - ජීවිත රක්ෂණය, හදිසි අනතුරු රක්ෂණය



JMC vLearning "your virtual learning partner"

**රක්ෂණයක් මගින් රක්ෂිතයාට ලාභයක් ලැබිය හැකිද ?**

ඉහත ප්‍රශ්ණයට නිවැරදි පිලිතුර වන්නේ " නැත " යන්නයි. එනම් රක්ෂණ මූලධර්ම වලට අනුව කිසිවෙකුටත් රක්ෂණයක් මගින් ලාභ ලැබිය නොහැකි අතර සම්භාව්‍ය/අහඹුරක්ෂණවලදී හැර සෙසු රක්ෂණ වලදී සිදුවන්නේ රක්ෂිතයාට සිදුවූ හානිය පිරවීම හෙවත් හානිපූර්ණයයි.

" **යමෙකුට හිතාමතාම හෝ වංචනිකව සිදු කල අලාභයක් අයකර ගත නොහැකිය "යන සංකල්පය මෙහිදී අදාල වේ.**

## රක්ෂණ මූලධර්ම

මින් අදහස් වන්නේ රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමේදී, පවත්වා ගැනීමේදී, ප්‍රතිලාභ ගැනීමේදී, අහෝසි කිරීමේදී අනුගමනය කරන මූලික සිද්ධාන්ත වේ.

- රක්ෂණ හිමිකම
- හානි පූර්ණය
- දායකත්වය
- ආදේශණය
- ආසන්නතම හේතුව
- උපරිම විශ්වාසය

## රක්ෂණ හිමිකම

රක්ෂණ හිමිකම යනු යම් දේපලක් රක්ෂණය කරන්නෙකුට එකී දේපල පැවතීමෙන් මූල්‍යමය වාසියක් ලැබීම හෝ එම දේපල විනාශ වීමෙන් මූල්‍යමය පාඩුවක් සිදු වීමයි.

රක්ෂණය කරන අවස්ථාවේදී රක්ෂිතයාට අදාල දේපල සම්බන්ධයෙන් රක්ෂණ හිමිකම තිබිය යුතුය. රක්ෂණය ලබා ගැනීමෙන් පසු රක්ෂණ හිමිකම අහිමි වුවද එය රක්ෂණ සහතිකයට බලපෑමක් ඇති නොකරයි.

⇨⇨ රක්ෂණ හිමිකමක් නොමැති නම් ජීවිත රක්ෂණයක් ශූන්‍ය හා අවලංගු එකක් වේ. ⇦⇦

JMC vLearning "your virtual learning partner"

# රක්ෂණ හිමිකමට සම්බන්ධ වැදගත් නඩුතීන්දු

**ග්‍රිෆිත්ස් එරෙහිව ෆ්ලෙමිං**

පුද්ගලයෙකුට තමාගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් ඇත. කලත්‍රයෙකුට, අනෙක් කලත්‍රයාගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් ඇත.

**හෝවාර්ඩ් එරෙහිව රෙෆියුජි ෆ්‍රෙන්ඩ්ලි සොසයිටි**

දෙමව්පියන්, දරුවන්ගෙන් පෝෂණය වනවා නම් මිස, දෙමව්පියන්ට දරුවන් කෙරෙහි රක්ෂණ හිමිකමක් නැත. එලෙසටම, දරුවන් දෙමව්පියන්ගෙන් පෝෂණය වනවා නම් මිස, දරුවන්ට දෙමව්පියන් කෙරෙහි රක්ෂණ හිමිකමක් නැත.

**එවැන්සන් එරෙහිව කෲක්ස්**

සහෝදර සහෝදරියන්ට සාමාන්‍යයෙන් එකිනෙකා සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් නැත.

**හෙබ්ඩන් එරෙහිව වෙස්ට්**

සේවකයෙකු හට ඔහුගේ සේවාකාලය තුල තම සේව්‍යයාගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් ඇත. ඊට හේතුව වන්නේ සේව්‍යයා මියගිය හොත් සේවකයාට රැකියාව සහ වැටුප අහිමි වන බැවිනි.

**ඩැල්බි එරෙහිව ඉන්ඩියා ඇන්ඩ් ලන්ඩන් ලයිෆ් ඇෂුවරන්ස් සමාගම**

ණය හිමියෙකුට ණයගැතියාගේ ජීවිතය සම්බන්ධයෙන් ( ණය වී ඇති ප්‍රමාණය දක්වා ) රක්ෂණ හිමිකමක් ඇත.

**බැන්ෆ්ර්ඩ් එරෙහිව සෝන්ඩර්ස්**

ඇපකරුවෙකුට, ප්‍රධාන ණයකරුගේ ( ණය ගැතියාගේ ) ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් ඇත.

මීට අමතරව ඇප කරුවන් දෙදෙනා එක්ව ඇපවී ඇති ණය මුදලේ අර්ධයක් දක්වා එක් එක් ඇපකරුවාට අනෙකාගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් ඇත.

🖋🖋 ජීවිත රක්ෂණයක් නොවන සාමාන්‍ය රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් පවතින්නේ අදාල දේපල සම්බන්ධයෙන් අයිතියක් හෝ ගිවිසුම්මය අයිතියක් ඇතොත් පමණි.
උදා -

A සතුව නිවසක් ඇත. ඔහුට තම නිවස කෙරෙහි රක්ෂණ හිමිකමක් ඇත.

එම නිවස A විසින් B ට කුලියට දෙයි නම් සහ එම කුලී කාලසීමාව තුල එම නිවස ගින්නේ හෝ වෙනත් ආපදාවකින් විනාශ වුවද එහි කුලිය ගෙවීමට කුලී නිවැසියා වන B එම කුලී ගිවිසුම මගින් බැඳී සිටින්නේ නම්, එම කුලී නිවැසියා වන B ට එම නිවස සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් ඇත් නමුත් මෙම රක්ෂණ හිමිකම එම කුලී ගිවිසුම මත පදනම් වූ ගිවිසුමමය අයිතියකි.

**<u>මැකව්රා එරෙහිව නොදර්න් ඇෂුවරන්ස් සමාගම</u>**

මැකව්රා යන අය තම ව්‍යාපාරය එක්තරා සමාගමකට විකිණීය. මැකව්රාගේ නමින් රක්ෂණය කර තිබූ දේපලද ඔහු එම සමාගමට විකිණීය. එලෙස විකුණු පසු එම දේපල ගිනි ගෙන විනාශ විය. තම රක්ෂණාවරණය යටතේ මැකව්රා වන්දි ඉල්ලා සිටින ලදී.

අධිකරණය මෙහිදී තීරණය කලේ එම දේපල විනාශ වන මොහොත වන විට මැකව්රා නැමැත්තාට එම දේපල සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් නොමැති බැවින් රක්ෂණ වන්දි ලබාගැනීමට ඔහුට හිමිකමක් නොමැති බවයි. තවද, එම දේපල විනාශ වන මොහොත වන විට එය මිලදී ගත් සමාගමේ නමින් එම දේපල සඳහා රක්ෂණාවරණයක් ලබා ගෙන නොතිබූ බැවින් එම සමාගම වෙතද රක්ෂණ වන්දි ගෙවීමට රක්ෂණ සමාගම බැඳී නොමැති බව තවදුරටත් තීරණය විය.

## <u>සාමුද්‍රික රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකම</u>

◆◆ මෙහිදී රක්ෂිතට හානිය සිදුවන අවස්ථාවේදී රක්ෂණ හිමිකම තිබිය යුතු අතර රක්ෂණය කරන අවස්ථාවේදී රක්ෂණ හිමිකම තිබීම අවශ්‍ය නැත. ◆◆

✹✹ මුහුදු ගමනක යෙදීමට උනන්දු වන පුද්ගලයෙකුට එම රක්ෂිත දේපල සුරක්ෂිතව ගමනාන්තයට ලඟාවීමෙන් වාසියක් සැලසෙන්නේ නම් හෝ හානිවීමෙන් හෝ රඳවා ගැනීමෙන් පාඩුවක්, අගතියක් සිදුවන්නේ නම් ඔහුට එම දේපල සම්බන්ධයෙන් රක්ෂණ හිමිකම ඇතැයි සැලකේ. එකී ආකාරයේ රක්ෂණ හිමිකමක් පහත පුද්ගලයන්ට තිබිය හැකිය.

- □ නැව් බැඳුම්කරයක් හෝ නැව් බඩු බැඳුම්කරයක් මත අදාල ණය හිමියාට ➡ අදාල ණය ප්‍රමාණයට...
- □ නැව් කපිතාන් සහ කාර්ය මණ්ඩලයට ➡ ඔවුන්ගේ වැටුප් ප්‍රමාණයට...
- □ නැව් ගාස්තු කලින් ගෙවන්නාට ➡ නැව් භාණ්ඩ වලට සිදුවන යම් හානියකදී ආපසු නොගෙවන මුදල් ප්‍රමාණයට...
- □ උකස් හිමියාට ➡ දේපලේ සම්පූර්ණ වටිනාකම ප්‍රමාණයට...

- ▫ උකස් ලාභියාට ➡ උකසට යටත්වන මුදල් ප්‍රමාණයට…
- ▫ අයිතිකරුට ➡ සම්පූර්ණ වටිනාකමේ ප්‍රමාණයට ( වෙනත් පාර්ශවයක් විසින් හානිපූර්ණය කිරීමට එකඟවී ඇති බව නොසලකා)
- ▫ ප්‍රතිරක්ෂකයෙකුට ➡ තමා භාරගන්නා අවධානමේ ප්‍රමාණයට…

රක්ෂණ හිමිකම ඇත.

### ❧ හානි පූර්ණය

මෙහිදී සිදුවන්නේ රක්ෂිතයාට සිදුව ඇති හානිය, රක්ෂණ ගිවිසුම ප්‍රකාරව රක්ෂකයා විසින් පිරවීමයි.

**කැස්ටලේන් එරෙහිව ප්‍රෙස්ටන්**

ගිනි හානි රක්ෂණාවරණයක් ලබාගෙන තිබූ නිවසක්, එහි රක්ෂිතයා විසින් ගැනුම්කරුවෙකුට විකිණීමට එකඟවී තිබූ අතර එය විකිණීමට පෙර ගින්නක් ඇතිවී නිවසට හානි සිදු විය. අදාල රක්ෂණාවරණය යටතේ රක්ෂණ වන්දි රක්ෂිතයාට හිමි විය. නිවස ගිනිගත් පසුවද, එම ගැනුම්කරු විසින් මුලින් එකඟ වු මුදලටම එම නිවස මිලදී ගන්නා ලදී. අධිකරණය මෙහිදී තීරණය කලේ ගැනුම්කරු වෙත ගෙවන ලද එම රක්ෂණ වන්දි මුදල් ආපසු අය කර ගැනීමේ හැකියාවක් රක්ෂණ සමාගමට ඇති බවයි. ඊට හේතුව වන්නේ එසේ නොවුණහොත් එම රක්ෂණ ක්‍රියාවලිය මගින් රක්ෂිතයාට අයුතු ලාභයක් ලැබෙන බැවින් සහ එසේ රක්ෂණයක් මගින් ලාභ ලැබීම නීතියට පටහැනි දෙයක් වන බැවිනි.

### ❧ දායකත්වය

මෙය හානි පූර්ණ මූලධර්මයේ උප මූලධර්මයක් වන අතර, ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් මෙම මූලධර්මය අදාල නොවේ.

යම් දේපලක් සඳහා රක්ෂකයන් කිහිපදෙනෙකු වෙතින් රක්ෂණාවරණ කිහිපයක් ලබා ගෙන තිබියදීවම දේපලට යම් හානියක් සිදු වුවහොත් එකී සියලුම රක්ෂකයන් විසිනු ගෙවනු ලබන රක්ෂණ වන්දි මුදල් වල එකතුවෙහි උපරිමය, අදාල දේපලට සිදුවූ හානියේ ප්‍රමාණය ඉක්මවන්නේ නැත. රක්ෂණය මගින් කිසිවෙකුටත් ලාභයක් ලැබිය නොහැක යන සිද්ධාන්තය මෙහිදී අදාල වේ.

එහිදී එක් එක් රක්ෂකයා විසින් ගෙවනු ලබන රක්ෂණ වන්දි මුදල පහත පරිදි වේ.

$$\text{වන්දිය} = \frac{\text{එම රක්ෂණ සමාගම නිකුත් කල ඔප්පුවේ වටිනාකම}}{\text{සියලුම රක්ෂණ සමාගම් නිකුත් කල ඔප්පු වල වටිනාකම}} \times \text{සිදුවූ අලාභය}$$

⊠ වටිනාකම රුපියල් මිලියන පහක් වන දේපලක් සඳහා එම සම්පූර්ණ වටිනාකම සඳහාම රක්ෂණ සමාගම් පහක් වෙතින් රක්ෂණාවරණ පහක් ලබා ගෙන තිබියදී එම දේපල සම්පූර්ණයෙන්ම විනාශ වුවහොත් රක්ෂිතයා වෙත ලැබෙන සම්පූර්ණ රක්ෂණ වන්දි ප්‍රමාණය කොපමණද ?

## ප්‍රතිනිවේශනය පිළිබඳ මූලධර්මය / ආදේශනය

මෙම රක්ෂණ මූලධර්මය අදාල වන්නේ හානිපූර්ණ රක්ෂණ වලට වන අතර සම්භාව්‍ය

රක්ෂණ වලට එය අදාල නොවේ. එනම් ජීවිත රක්ෂණ වලට හෝ හදිසි අනතුරු

රක්ෂණවලට එය අදාල නොවේ.

මෙහි අදහස නම් යම් රක්ෂණාවරණයකට අදාලව රක්ෂකයෙක් විසින් රක්ෂිතයෙක් වෙත රක්ෂණ වන්දි ගෙවා ඇත්නම්, තෙවන පාර්ශවයකට එරෙහිව ඕනෑම නෛතික පියවරක් ගැනීමට රක්ෂිතයාට තිබූ අයිතිය, රක්ෂකයා වෙත හිමි වන බවයි.

පහත උදාහරණය සලකන්න.

රනිල් විසින් තමාගේ මෝටර් රථ කම්හල සඳහා ABC රක්ෂණ සමාගමෙන් ගිනි හානි රක්ෂණාවරණයක් ලබා ගනී. එම කම්හල වෙත පැමිණෙන මහින්දගේ නොසැලකිලිමත් ක්‍රියාවක් හේතුවෙන් එහි ගින්නක් ඇති විය. දිලික්ත නීතියට අනුව මහින්දගේ නොසැලකිලිමත් ක්‍රියාව පිළිබඳව මහින්දට එරෙහිව නඩු පවරා වන්දි අය කර ගැනීමේ අයිතියක් රනිල්ට ඇත. තවද, මෙම දේපල සඳහා ගිනි හානි රක්ෂණාවරණයක් රනිල් විසින් ලබාගෙන ඇති නිසා ABC රක්ෂණ සමාගමෙන් රක්ෂණ වන්දියක් අය කර ගැනීමේ අයිතියක් රනිල්ට ඇත.

රනිල්ට එසේ වන්දි හිමිවුව හොත් තවදුරටත් මහින්දට විරුද්ධව නඩු පැවරීමේ අයිතියක් රනිල්ට නැත. ඊට හේතුව වන්නේ එකම සිදුවීමක් පිළිබඳව දෙගුණයක් වන්දි ලබා ගෙන අයුතු ලෙස ධනවත් වීමට නීතියෙන් ඉඩක් නොමැති බැවිනි. එවිට මහින්දට විරුද්ධව නඩු පැවරීම සඳහා රනිල්ට තිබූ අයිතිය ABC රක්ෂණ සමාගම වෙත මාරු වේ.

**⊗⊗ එනම්, මෙහිදී රක්ෂිතයාට ඇති හිමිකමක් රක්ෂිතයා වෙත මාරු වී ඇත. එනම් රක්ෂකයා, රක්ෂිතයාගේ තත්වයට පත්වී ඇත. ⊗⊗**

## ❧ ආසන්නතම හේතුව

ආසන්නතම හේතුව ලෙස සැලකෙන්නේ යම් රක්ෂිත දේපලකට යම් හානියක් සිදුව ඇති අවස්ථාවකදී කාලය අතින් සමීපතම හේතුව නොව, එම සිදුවීම කෙරෙහි බලපාන වඩාත් කාර්යක්ෂම සහ ක්‍රියාශ්‍රීලී හේතුවයි. මෙහිදී අදාල ආසන්නතම හේතුවට අදාල සිදුවීම සඳහා රක්ෂණාවරණය ලබාගෙන ඇත්නම් පමණක් වන්දි ගෙවීම සිදු කරයි.

උදා - කුමාරගේ මෝටර් රථය සඳහා සම්පූර්ණ රක්ෂණයක් ලබා ගෙන ඇදි අවස්ථාවකදී එයට ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයකින් හානි සිදුවේ යැයි සිතන්න. එම රක්ෂණ ඔප්පුව යටතේ කැරලි කෝලාහල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය නොවේ නම් ඉහත හානිය සඳහා රක්ෂණ සමාගම වෙතින් රක්ෂණ වන්දි ලබා ගැනීමේ හැකියාවක් නොමැත.

## ❧ උපරිම විශ්වාසය පිලිබඳ මූලධර්මය

ලතින් භාෂාවෙන් මෙම මූලධර්මය උබෙරිමා ෆීඩෙයි ( Uberrimae Fidei ) ලෙස හැඳින්වේ. මෙම මූලධර්මයෙන් අදහස් කෙරෙන්නේ රක්ෂකයෙකුට, තමා භාරගන්නා අවධානමේ ප්‍රමාණය නිවැරදිව තක්සේරු කරගැනීමට හැකිවන පරිදි රක්ෂිතයා විසින් රක්ෂණය පිලිබඳව තමා දන්නා හෝ දැනගත යුතු සියලු වැදගත් කරුණු රක්ෂකයා වෙත හෙලිදරව් කිරීමේ වගකීමක් පවතින බවයි.

**<u>ඉහත සඳහන් වැදගත් කරුණු යනු</u>** අවදානම භාර ගන්නවාද ? නැද්ද ? යන්න තීරණය කිරීමේදීත්, අවදානම භාර ගන්නේ නම් රක්ෂණ වාරිකය තීරණය කිරීමේදීත් ඥානාන්විත රක්ෂකයෙකුට බලපාන කරුණු ය.

**<u>ලන්ඩන් ඇෂුවරන්ස් එරෙහිව මැන්සෙල්</u>**

අයෙක් ජීවිත රක්ෂණයක් ඉල්ලුම් කලේය. එවැනි ජීවිත රක්ෂණයක් සඳහා වෙනත් රක්ෂණ සමාගම් වලින් තිබේදැයි යනුවෙන් ඇසූ ප්‍රශ්ණයට ඔහු විසින් දුන් පිලිතුර වූයේ වෙනත් රක්ෂණ සමාගම් දෙකකින් එවැනි ජීවිත රක්ෂණ ලබා ගෙන ඇති බවයි. එහෙත් ඔහුගේ රක්ෂණ ඉල්ලීම රක්ෂණ සමාගම් කිහිපයකින් ප්‍රතික්ෂේප කර තිබූ බව ඔහු විසින් හෙලිදරව් නොකලේය.

අධිකරණය මෙහිදී තීරණය කලේ වැදගත් කරුණු හෙලි නොකිරීම මත මෙහි ඉල්ලුම්කරු ( රක්ෂිතයා ) විසින් උපරිම විශ්වාසය පිලිබඳ මූලධර්මය කඩ කර ඇති බවයි. ඒ අනුව රක්ෂණ සහතිකය ( රක්ෂණ ගිවිසුම ) අවලංගු කල හැකි එකක් බව මෙහිදී තීරණය විය.

**<u>ලූකර් එරෙහිව යූනියන් ඇෂුවරන්ස් සමාගම</u>**

ජීවිත රක්ෂණයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රය පිරවීමේදී තමා එක් වතාවක් නිව්මෝනියාව රෝගයෙන් පෙලුණ බව ඉල්ලුම්කරු හෙලි නොකලේය. ජීවිත රක්ෂණය ලබාගැනීමෙන් පසු ඔහු නිව්මෝනියාව රෝගය වැලදී මිය ගියේය.

අධිකරණය මෙහිදී තීරණය කලේ මෙය වැදගත් කරුණක් හෙලි නොකිරීමක් වන නිසා උපරිම විශ්වාසය නැමැති මූලධර්මය මෙහිදී කඩවී ඇති බැවින් රක්ෂණ ගිවිසුම අවලංගු කිරීමට රක්ෂණ සමාගමට හැකියාව ඇති බවයි.

**<u>වූල්කෝට් එරෙහිව සන් අලායන්ස් ඇන්ඩ් ලන්ඩන් අලායන්ස්</u>**

අයෙක් තම නිවස සඳහා ගිනි හානි රක්ෂණයක් ලබාගත් අතර යෝජනා පත්‍රය පිරවීමේදී ඔහු කලින් සොරකමකට වරදකරුවෙකු වී ඇති බව හෙලි නොකලේය. ඔහුගේ නිවස ගින්නෙන් හානියට පත්වූ විට රක්ෂන සමාගම විසින් වන්දි ගෙවීස ප්‍රතික්ෂේප කලේය. රක්ෂිතයාගේ ස්ථාවරය වූයේ තමාගේ අතීතය පිලිබඳව කිසිවක් අසා නොතිබුණ බවත් එසේ අසා තිබුණි නම් එම හෙලිකිරීම සිදු කල හැකිව තිබූ බවත්ය.

අධිකරණය මෙහිදී තීරණය කලේ අදාල අපරාධ වාර්තාව හෙලි නොකිරීම ඔහුගේ සදාචාරය පිලිබඳ සැකයක් ඇති කිරීමක් වන බැවින් එය හෙලි කොට තිබුණේ නම් රක්ෂකට ඒ පිලිබඳව කලින් මැන බැලීමට හැකිව තිබූ බවයි. එය වැදගත් කරුණක් හෙලිදරව් නොකිරීමක් වන බැවින් රක්ෂකට , රක්ෂණ සහතිකය ( රක්ෂණ ගිවිසුම ) අවලංගු කිරීමට හැකියාව ඇති බව වැඩි දුරටත් මෙහිදී තීරණය විය.

➝➝ ඒ අනුව පෙනී යන්නේ **<u>රක්ෂණ නීතියට අදාලව උපරිම විශ්වාසය යනු රක්ෂණ අයදුම්පතෙහි සඳහන් ප්‍රශ්ණ වලට නිවැරදිව පිලිතුරු දීමට වඩා වැඩිමනත් දෙයක් බවයි.</u>**

**<u>ඕ'කෝනර් එරෙහිව BDB ක'ර්බි සහ සමාගම</u>**

එක්තරා තැනැත්තෙක් තම රක්ෂණ ඉල්ලුම්පත්‍රයේ වැරදීමකින් සඳහන් කලේ තම මෝටර් රථය රාත්‍රී කාලයේදී සාමාන්‍යයෙන් තම නිවසේ ගරාජයේ නවතා තබන බවයි. නමුත් එය රාත්‍රියේදී සාමාන්‍යයෙන් නවත්වන්නේ නිවස අසල මාර්ගයේය. එසේ නිවස අසල මාර්ගයේ නවතා තිබියදී මෝටර් රථයට හානි සිදු විය.

අධිකරණය මෙහිදී තීරණය කලේ මෙහි කරුණු වරදවා දැක්වීම සිතා මතා කරන ලද්දක් නොවුවද රක්ෂිතයා වෙත වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතියක් රක්ෂණ සමාගමට ඇති බවයි.

**<u>බුල්ජන්ස් එ. සිලෝන් ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ්</u>** නඩුවේදී අධිකරණය තීරණය කලේ අවිනිශ්චිත සහ උපක්‍රමශීලී ප්‍රශ්ණ රක්ෂණ අයදුම්පතේ අසා ඇති බැවින් රක්ෂකයා රක්ෂණ වන්දි ගෙවිය යුතු බවයි.

JMC vLearning "your virtual learning partner"

## ජීවිත රක්ෂණයක් සහ වෙනත් රක්ෂණයන් අතර ඇති වෙනස්කම්

➪➪ සාමාන්‍ය රක්ෂණයකදී රක්ෂණය කරන්නේ අවිනිශ්චිත සිදුවීමකි. එහෙත් ජීවිත රක්ෂණයකදී අදාල සිදුවීම ( මරණය ) නිශ්චිත වන අතර එහෙත් එය සිදුවන දිනය අවිනිශ්චිත වේ. ⇦⇦

➪➪ සාමාන්‍ය රක්ෂණයකදී යමෙකුට, වෙනත් අයෙකුට අයත් දේපලක් රක්ෂණය කල නොහැක. එහෙත් ජීවිත රක්ෂණයකදී යමෙකුට, වෙනත් අයෙකුගේ ජීවිතයක් වුවද රක්ෂණය කල හැක.⇦⇦

➪➪ සාමාන්‍ය රක්ෂණයකදී අදාල රක්ෂණ ගිවිසුමට සාපේක්ෂව හානිපූර්ණය කිරීමක් සිදු වුවත්, ජීවිත රක්ෂණයකදී රක්ෂණ ගිවිසුමේ සඳහන් ආකාරයට මුදල් ගෙවීමක් සිදු වන අතර ජීවිත රක්ෂණයකදී හානිපූර්ණයක් සිදු නොවේ. ⇦⇦

➪➪ සාමාන්‍ය රක්ෂණයකදී සාමාන්‍යයෙන් රක්ෂකයා වෙත රක්ෂිතයා විසින් ගෙවන ලද මුදල ආපසු ගෙවීමක් සිදු නොකරනු ලබන අතර, එහෙත් ජීවිත රක්ෂණයක් කල් පිරීමකදී රක්ෂිතයා විසින් රක්ෂකයා වෙත ගෙවනු ලැබූ මුදල පොලියක්ද සමග ආපසු ගෙවීමක් සිදුවේ.

## ගිනි රක්ෂණය

යම් නිශ්චිත කාලයක් තුල ගින්නක් හේතුවෙන් රක්ෂිතයාගේ රක්ෂණය කරන ලද අදාල දේපල වලට අලාභයක් වුවහොත් හෝ රක්ෂිතයාට තුවාලයක් සිදු වුවහොත් ඔහුට සිදුවූ එම අලාභය , රක්ෂණ ගිවිසුමේ සඳහන් ප්‍රමාණය දක්වා පියවීමක් හෙවත් ප්‍රතිපූර්ණය කිරීමක් මෙහිදී සිදුවේ.

මෙහිදී රක්ෂිතයාගේ නොසැලකිල්ලක් නිසා අදාල දේපල ගිනි ගෙන තිබුනද රක්ෂණ වන්දි ගෙවීමක් සිදුවේ. එහෙත් රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් අයෙකු විසින් සිදුකල ගිනි තැබීමකදී මෙම හානි පූර්ණ අයිතිවාසික් රක්ෂිතයාට අහිමි වේ.

### හැරිස් එරෙහිව පෝලන්ඩ්

තම ස්වර්ණාභරණ සඳහා ගිනිහානි රක්ෂණයක් ලබාගත් කාන්තාවක් එම රන්බඩු ගිනි උදුනක ගල් අඟුරු යට සඟවා තබන ලදී. පසුව ඇයට අමතක වීමෙන් එම ගිනි උදුන දැල්වීම නිසා එම රන්බඩු වලට හානි සිදු විය. අධිකරණය මෙහිදී තීරණය කලේ අදාල ගිනි හානි රක්ෂණය යටතේ ඇයට රක්ෂණ වන්දි ලබා ගත ..........................................................................

↳↳ මෙහිදී හිමිවන / ගෙවනු ලබන වන්දි මුදල තීරණය වන්නේ අදාල රක්ෂිත වටිනාකම, එම දේපලේ සත්‍ය වටිනාකමට දක්වන අනුපාතය මතය. ↲↲

**ගෙවනු ලබන වන්දිය = $\frac{\text{රක්ෂිත වටිනාකම}}{\text{සත්‍ය වටිනාකම}}$ × සිදුවූ අලාභය**

JMC vLearning
"your virtual learning partner"

**ප්‍රශ්ණය** - සැබෑ වටිනාකම රුපියල් මිලියනයක් වන දේපලක් රක්ෂණ වටිනාකම රුපියල් 750,000/- කට රක්ෂණය කර ඇත.

I ) මුලු දේපලම විනාශ වුවහොත් හිමිවන රක්ෂණ වන්දිය කොපමණද ?

..........................................................................................................................................

..........................................................................................................................................

II ) එම දේපලෙන් 60 % ක් විනාශ වුවහොත් හිමිවන රක්ෂණ වන්දිය කොපමණද ?

..........................................................................................................................................

..........................................................................................................................................

## <u>පුද්ගලික අනතුරු / හදිසි අනතුරු රක්ෂණය</u>

මෙය හානිපූර්ණ රක්ෂණයක් නොවේ. මෙහි ඇත්තේ යම් සිදුවීමක් මත යම් නිශ්චිත මුදලක් ගෙවීමට ඇතිකර ගන්නා එකඟතාවයකි. රක්ෂිතයා හදිසි අනතුරකින් මිය ගියහොත් රක්ෂිත මුදල ඔහුගේ පොල්මෑකරුවන්ට ගෙවනු ලැබේ. රක්ෂිතයා පූර්ණ හෝ අර්ධ බෙලහීනතාවයකට පත් වුවහොත් අඩු මුදලක් වන්දි ලෙස ගෙවනු ලැබේ.

මෙය රථවාහන රක්ෂණය, ගිනි රක්ෂණය ආදියෙන් වෙන්කොට හඳුනාගත යුතුය. මහජන වගකීම් රක්ෂණය, නිෂ්පාදන වගකීම් රක්ෂණය, වෘත්තීය වගකීම් රක්ෂණය, කම්කරු වන්දි රක්ෂණය, ගෙවල් බුදු රක්ෂණය ආදිය මේ යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග වේ.

## <u>සාමුද්‍රික රක්ෂණය ( නාවික රක්ෂණය )( මුහුදු රක්ෂණය )</u>

සාමුද්‍රික රක්ෂණය යනු මුහුදු ගමනකදී නෞහෝ නැව්ගත භාණ්ඩ වලට මුහුදේදී සිදු විය හැකි හානි සඳහා වන්දි ලබාගැනීම වෙනුවෙන් රක්ෂකයා සහ රක්ෂිතයා අතර ඇති වන ගිවිසුමකි.

මේ යටතේ මුහුදු ගමනකදී නැවට හෝ නැව් බඩු වලට ගින්නෙන්, අයහපත් කාලගුණයෙන්, අකුණු ගැසීමෙන්, පිපිරීමකින්, ගැටීමකින්, මුහුදුබත් වීමකින්, යාන්ත්‍රික දෝෂයකින්, සතුරු කරදරයකින්, බඩු පැටවීමේදී හා බෑමේදී සිදුවන උවදුරු රක්ෂණය කල හැකිය.

## <u>සාමුද්‍රික රක්ෂණ වර්ග</u>

- ✈ මුහුදු ගමන් සහතික ➔ මෙහිදී යම් දේපලක් යම් නිශ්චිත මුහුදු ගමනක් සඳහා පමණක් රක්ෂණය කෙරේ.
- ✈ වාර රක්ෂණය ➔ මෙහිදී යම් දේපලක් යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා



JMC Vlearning "your virtual learning partner"

පමණක් රක්ෂණය කෙරේ.

✈ පාවෙන සහතික ➝ මෙහිදී නැවේ නම සහ අනෙකුත් විස්තර මුලදී සඳහන් නොකර රක්ෂණය සිදුකර පසුව එම විස්තර නිශ්චය කෙරේ.

✈ වටිනාකම් නිශ්චිත සහතික ➝ මෙහිදී රක්ෂිත දේපලට අදාලව එකඟවූ රක්ෂිත වටිනාකම සඳහන් කෙරේ.

✈ වටිනාකම නිශ්චය නොකල සහතික ➝මෙහිදී දේපලේ රක්ෂිත වටිනාකමේ සීමාවට යටත්ව විෂය වස්තුවේ වටිනාකම පසුව නිශ්චය කෙරේ.

## සාමුද්‍රික රක්ෂණයකදී ප්‍රතිඥාහාර

**✱✱ ඉතා වැදගත්** ➡ ප්‍රතිඥාහාරක් යන සාපේක්ෂව වැදගත්කම අඩු දෙයක්ය. එහෙත් සාමුද්‍රික රක්ෂණයකදී ප්‍රතිඥාහාරක් යන වචනයට එහි සාමාන්‍ය අර්ථය නොයෙදේ.

**✍✍✍ ඒ අනුව සාමුද්‍රික රක්ෂණයකදී ප්‍රතිඥාහාරක්, වැදගත් වුවත් නොවුවත් එය ඒ ආකාරයෙන්ම පිලිපැදිය යුතුය. ✍✍✍**

මුහුදු රක්ෂණයකදී අදාල වන ව්‍යංග ප්‍රතිඥාහාර පහත පරිදිය.

1. මුහුදු ගමන ආරම්භයේදී නැව, අදාල මුහුදු ගමන සඳහා යෝග්‍ය තත්වයේ තිබිය යුතුය.

2. මුහුදු ගමන අදියරෙන් අදියර ක්‍රියාත්මක වන අවස්ථාවකදී, නැව ඒ එක් එක් අදියරේ මුහුදු ගමන සඳහා යෝග්‍ය තත්වයේ තිබිය යුතුය.

**Greenock SS Co. Vs Maritime Insurance Co. Ltd** - මෙහිදී මුහුදු ගමන් රක්ෂණයක් ලබා ගෙන තිබුනු නැවක් එහි ඉන්ධන ලෙස යෙදවීමට ප්‍රමාණවත් තරම් ගල්අඟුරු තබා නොගෙන එක් පවරායක සිට තවත් වරායක් කරා ගමන් ඇරඹීය. එමනිසා ගමන අතරමගදී නැවේ ක්‍රියාකාරීත්වය අඛණ්ඩව පවත්වා ගැනීම උදෙසා එම නැවේ සවිකර තිබූ සමහර කොටස් ගල් අඟුරු වලට විකල්පයක් ලෙස දහනය සඳහා උපයෝගී කරගන්නා ලදී.

අධිකරණය මෙහිදී තීරණය කලේ මුහුදු ගමන ආරම්භයේදී නැව එම මුහුදු ගමන සඳහා යෝග්‍ය විය යුතු බවට වූ ව්‍යංග ප්‍රතිඥාහාරය මෙහිදී කඩවී ඇති බවත් එම නිසා නෞකාවේ තිබූ සමහර කොටස් වලට වූ හානිය සම්බන්ධයෙන් වන්දි ගෙවීමට රක්ෂිතයා නොබැඳෙන බවත්ය.

3. මුහුදු ගමන ආරම්භයේදී නැව මුහුදු ගමන සඳහා මෙන්ම රක්ෂණ සහතිකයෙන් අදහස් කල ගමනාන්තය දක්වා භාණ්ඩ ගෙනයාමට යෝග්‍ය තත්වයේ තිබිය යුතුය.

4. නෞකාව වරායේ නැංගුරම් ලා ඇති විට, සිදුවිය හැකි හානි වලට මුහුණ දීමට තරම් යෝග්‍ය මට්ටමක එය තිබිය යුතුය.

5. මුහුදු ගමන නීත්‍යානුකූල විය යුතු අතර නීතියට අනුව කටයුතු කරන බවටද ව්‍යංග ප්‍රතිඥාහාරයක් ඇත.



JMC vLearning "your virtual learning partner"

## අත්හැර දැමීමේ නිවේදනය

මේ වනාහි රක්ෂිතයා විසින් අදාල රක්ෂිත දේපල මුලුමනින්ම කොන්දේසි විරහිතව අත්හල බව පැහැදිලි කෙරෙන වාචික හෝ ලිඛිත නිවේදනයකි. මෙම නිවේදනය රක්ෂක විසින් පිලිගන්නේ නම් එහි අදහස වන්නේ රක්ෂක විසින් අලාභයේ වගකීම භාරගත් බවයි. විෂය වස්තුව අත්හැරීමේදී, එහි සියලුම ශේෂයන් පිලිබඳව රක්ෂිතට ඇති අයිතිවාසිකම් තමා වෙත පවරා ගැනීමට රක්ෂකයාට හිමිකමක් ලැබේ.

## සාමුද්‍රික රක්ෂණයකදී ප්‍රතිපූර්ණය ( ගෙවනු ලබන වන්දි මුදල ) නිශ්චය කිරීම

අගය නිශ්චය කල රක්ෂණ සහතිකයක් තිබියදී පූර්ණ අලාභයක් සිදුවූ විට අදාල රක්ෂණයෙන් නියම කල මුදල් ප්‍රමාණය ප්‍රතිපූර්ණය කෙරේ.

අගය නිශ්චය නොකල රක්ෂණ සහතිකයක් තිබියදී පූර්ණ අලාභයක් සිදු වූ විට ප්‍රතිපූර්ණය කල යුතු මුදල් ප්‍රමාණය වන්නේ එම විෂය වස්තුව රක්ෂණය කල හැකි වටිනාකමයි.

## රක්ෂණ ඔප්පුවක් පැවරීම

↳↳↳ මින් අදහස් වන්නේ විෂය වස්තුව හා එහි අන්තර්ගතය පිලිබඳ රක්ෂිතයාට ඇති අයිතිවාසිකම් හිමිකම් හා පිලියම් රක්ෂකයා වෙත පැවරීමයි. එම පැවරීම මගින් රක්ෂකයාට තමාගේ නමින් තෙවන පාර්ශවයකට විරුද්ධව නීතිය මගින් කටයුතු කිරීමට හැකි තත්වයකට රක්ෂකයා පත්වෙයි. ↵↵↵

### ජීවිත රක්ෂණයකදී රක්ෂණ ඔප්පුව පැවරීම

ඔප්පුව පිටසන් කිරීමෙන් හෝ නිශ්චිත ආකෘති පත්‍රයක වෙනම ලියවිල්ලක් මගින් ජීවිත රක්ෂණ ඔපුප්ව පැවරීම කල හැකිය. පසුව රක්ෂකට ලිඛිත දැන්වීමක් මගින් ඒ බව සන්නිවේදනය කල යුතුය.

### ගිනිහානි රක්ෂණයකදී රක්ෂණ ඔප්පුව පැවරීම

ගිනිහානි රක්ෂණයක් පැවරිය හැක්කේ රක්ෂකගේ කැමැත්ත ඇත්නම් පමණි.

### සාමුද්‍රික රක්ෂණයකදී රක්ෂණ ඔප්පුව පැවරීම

මුහුදු රක්ෂණයක් පිටසන් කිරීම මගින් පැවරිය හැකිය. මෙම පැවරීම අලාභය සිදුවීමට පෙර හෝ පසු සිදු කල හැකිය. පැවරුම ලද්දාට තමාගේ නමින් රක්ෂණ සහතිකය මත නඩු පැවරිය හැකිය. එහෙත් විෂය වස්තුවක හිමිකම අත්හල රක්ෂිතයෙකුට එලෙස නඩු පැවරීමට හැකියාවක් නැත.

JMC vLearning
"your virtual learning partner"

# කුලී සින්නක්කර, කල්බදු, ණය සහ සුරැකුම්

## කුලී සින්නක්කර

මෙරට තුල කුලී සින්නක්කර ගිවිසුම් පාලනය වන්නේ 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනත සහ එහි සංශෝධනයන් මගිනි. කුලී සින්නක්කර සඳහා අදාල වන පොදු නීතිය වන්නේ රෝම ලන්දේසි නීතියයි.

**කුලී සින්නක්කර ගිවිසුමක් යනු කුමක්ද ?**

කුලී සින්නක්කර ගිවිසුමක් යනු " යම් තැනැත්තෙකුට භාණ්ඩ කුලියට දෙනු ලබන එම තැනැත්තා එකඟ වූ මුදල් ප්‍රමාණයක් කාලීන වාරික වලින් ගෙවන බවට වූ කොන්දේසිය මත භාණ්ඩ වල අයිතිකරු විසින් ඒ තැනැත්තාට භාණ්ඩ වල සන්තකය භාර දෙනු ලබන ගිවිසුමකි. "

ඒ අනුව සින්නක්කර ගිවිසුමකදී සින්නක්කර හිමියා වෙතින් සින්නක්කර ගැනුම්කරු වෙත පැවරෙන්නේ භාණ්ඩයේ සන්තකය යි.

## කුලී සින්නක්කර ගිවිසුමක පාර්ශවකරුවන්

මෙහි පාර්ශවකරුවන් වන්නේ කුලී සින්නක්කර හිමියා සහ කුලී සින්නක්කර ගැනුම්කරුය.

**කුලීසින්නක්කර හිමියා ( කුලියට දෙන්නා ) යනු** කුලීසින්නක්කර ගිවිසුමක් යටතේ භාණ්ඩ කුලියට දෙන්නා වූ හෝ භාණ්ඩ විකිණීමට එකඟ වන්නාවූ තැනැත්තාය. ( අයිතිකරු )

තවද, කුලී සින්නක්කර ගිවිසුම යටතේ කුලී සින්නක්කර හිමියාගේ භාණ්ඩ වල හිමිකම හෝ සින්නක්කර හිමියාගේ අයිතිවාසිකම් හෝ බැඳීම් වලින් කිසිවක් පවරා දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් පැවරී ඇති ( ලැබී ඇති ) අයෙක්ද සින්නක්කර හිමියා යන අර්ථයට අයත් වේ.

**කුලී සින්නක්කර ගැනුම්කරු ( කුලියට ගන්නා ) යනු** සින්නක්කර ගිවිසුමක් යටතේ අයිතිකරුවෙකුගෙන් භාණ්ඩවල සන්තකය ලබා ගන්නා වූ හෝ ලබා ගෙන ඇත්තාවූ අයෙකි.

තවද, කුලී සින්නක්කර ගිවිසුම යටතේ කුලී සින්නක්කර ගැනුම්කරුගේ අයිතිවාසිකම් හෝ බැඳීම් පවරා දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් පැවරී ඇති ( ලැබී ඇති ) අයෙක්ද කුලී සින්නක්කර ගැනුම්කරු යන අර්ථයට අයත්ය.

## කුලී සින්නක්කර ගිවිසුම් සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුම්

ඒ අනුව කුලී සින්නක්කර ගිවිසුමකදී යම්කිසි භාණ්ඩයක් කුලියට දීම සහ කුලියට ගැනීමක් සඳහා පාර්ශවයන් දෙකක් අතර ගිවිසුමක් ඇති වන අතර එකී ගිවිසුම තුලම එම භාණ්ඩය

මිලදී ගැනීමේ අයිතිය ( එනම්, භාණ්ඩයේ හිමිකම තමා වෙත ලබාගැනීම ) විකල්පයක් ලෙස ඇත.

එනම් කුලී සින්නක්කර ගිවිසුමේ නියම වලට අනුකූලව භාණ්ඩ මිලදී ගැනීමේ අයිතිවාසිකම කුලී සින්නක්කර ගැනුම්කරුට ඇත. නැතහොත් කුලී සින්නක්කර ගිවිසුමේ වාරික වලින් අවසාන වාරිකයත් නිසි පරිදි ගෙවීම මත එම භාණ්ඩ වල අයිතිය කුලී සින්නක්කර ගැනුම්කරු වෙත පැවරේ.

පහත උදාහරණයන් සලකන්න.

**අංක 01 උදාහරණය**

" ඒ "නැමැත්තා "බී" නැමැත්තා සමග භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට එලඹෙන්නේ ඒ සතුව පැවති භාණ්ඩයක හිමිකම "බී" වෙත පැවරීමටත් "බී" විසින් එම භාණ්ඩයේ විකුණුම් මිල සමාන වාරික 10 කින් ගෙවීමටත් යැයි සිතන්න. එවිට මෙම ගිවිසුම ප්‍රකාරව භාණ්ඩයේ හිමිකම එහි ගැනුම්කරු වන "බී" වෙත පැවරේ.( එය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් වන නිසා, භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව. ) තවද, එකී භාණ්ඩ විකිණීමේ ගිවිසුම ප්‍රකාරව අදාල වාරික මුදල් නිසි පරිදි ගෙවීමේ වගකීම "බී" වෙත පැවරෙන අතර, වාරික වලින් යම් කොටසක් පමණක් ගෙවා ඉතිරිය ගෙවීමට තමා හට හැකියාවක් නොමැති බව පවසා, එම භාණ්ඩය නැවත " ඒ " වෙත ලබාදීමේ **අයිතියක්** "බී" ට නොමැත. "බී" විසින් එම වාරික යම් ප්‍රමාණයක් ගෙවීම පැහැර හැරියහොත් එවිට නිර්දෝෂී පාර්ශවය වන " ඒ " ට ඇති අයිතිය වන්නේ එකී ගෙවීම පැහැර හැර ඇති වාරික වල වටිනාකම හා ඊට අදාල පොලිය, නඩු ගාස්තු ආදිය අය කර ගැනීමේ අයිතියයි.

**අංක 02 උදාහරණය**

" ඒ "නැමැත්තා "බී" නැමැත්තා සමග කුලී සින්නක්කර ගිවිසුමකට එලඹෙන්නේ ඒ සතුව පැවති භාණ්ඩයක සන්තකය "බී" වෙත පැවරීමටත් "බී" විසින් එම භාණ්ඩයේ කුලී සින්නක්කර මිල සමාන වාරික 10 කින් ගෙවීමටත් යැයි සිතන්න. එවිට මෙම ගිවිසුම ප්‍රකාරව භාණ්ඩයේ හිමිකම එහි ගැනුම්කරු වන "බී" වෙත නොපැවරෙන අතර වන "බී" වෙත පැවරෙන්නේ එහි සන්තකය පමණි.( 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනතේ 31 වගන්තිය ප්‍රකාරව. ) තවද, එකී කුලී සින්නක්කර ගිවිසුම ප්‍රකාරව අදාල වාරික මුදල් නිසි පරිදි ගෙවීමේ වගකීම "බී" වෙත පැවරෙන අතර, එහෙත් වාරික වලින් යම් කොටසක් පමණක් ගෙවා ඉතිරිය ගෙවීමට තමා හට හැකියාවක් නොමැති බව පවසා, එම භාණ්ඩය නැවත " ඒ " වෙත ලබාදීමේ **අයිතියක්** "බී" ට ඇත. "බී" විසින් එම වාරික යම් ප්‍රමාණයක් ගෙවීම පැහැර හැරියහොත් එවිට නිර්දෝෂී පාර්ශවය වන " ඒ " ට එකී භාණ්ඩයේ සන්තකය නැවත තමා වෙත ලබා ගැනීමේ අයිතියක් ඇත.

## කුලී සින්නක්කර ගිවිසුමකට අදාල පරම අයිතිකරු

කුලී සින්නක්කර ගිවිසුමකට අදාල දේපලක පරම අයිතිකරු වන්නේ කුලී සින්නක්කර හිමියා වන අතර කුලී ගැනුම්කරු විසින් එකී කුලී සින්නක්කර ගිවිසුමට අදාල අවසන් වාරිකයත් නිසි පරිදි ගෙවා අවසන් වූ පසුව කුලී ගැනුම්කරුට පරම අයිතිකරුගේ තත්වයට පත්වීමට හැකියාව ඇත.

**<u>කුලී සින්නක්කර ගිවිසුමකදී හිමිකම පැවරීම</u>**

කුලී සින්නක්කර ගිවිසුමකදී , එහි විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් මිලදී ගැනීම සම්පූර්ණ කල විට පමණක් භාණ්ඩ වල හිමිකම කුලී සින්නක්කර ගැනුම්කරු වෙත පැවරේ.

**<u>කුලී සින්නක්කර ගිවිසුමක් සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් අතර වෙනස්කම්</u>**

| භාණ්ඩ විකිණීමේ ගිවිසුම | කුලී සින්නක්කර ගිවිසුම |
|---|---|
| ............................................................... | ............................................................... |
| ............................................................... | ............................................................... |
| ............................................................... | ............................................................... |
| ............................................................... | ............................................................... |
| ............................................................... | ............................................................... |
| ............................................................... | ............................................................... |
| ............................................................... | ............................................................... |

**<u>කුලී සින්නක්කර ගැනුම්කරුගේ වගකීම්</u>**

- කුලී සින්නක්කර ගිවිසුම අනුව කටයුතු කිරීම.

එම ගිවිසුම ප්‍රකාරව නිසි පරිදි වාරික මුදල් ගෙවීමට කුලී සින්නක්කර ගැනුම්කරු බැඳී සිටියි.

- භාණ්ඩ ඇති ස්ථානය පිලිබඳ තොරතුරු අයිතිකරුට ( කුලී සින්නක්කර හිමියාට ) ලබා දීම.

කුලී සින්නක්කර හිමියා විසින් ලිඛිතව ඉල්ලීමක් කල විට අදාල භාණ්ඩ ඇති ස්ථානය පිලිබඳව කුලී සින්නක්කර හිමියා වෙත දැනුම්දීමට කුලී සින්නක්කර ගැනුම්කරු බැඳී සිටී.

- කුලී සින්නක්කර ගිවිසුම ප්‍රකාරව භාණ්ඩ පාවිච්චි කිරීම.

කුලී ගැනුම්කරු විසින් කුලී සින්නක්කර ගිවිසුම ප්‍රකාරව භාණ්ඩ පාවිච්චි නොකිරීම නිසා කුලී සින්නක්කර හිමියා හට සිදුවන යම් අලාභයන් සඳහා වන්දි ගෙවීමට කුලී ගැනුම්කරු බැඳී සිටියි.

- භාණ්ඩ පිලිබඳව සැලකිලිමත් වීම.

JMC vLearning "your virtual learning partner"

නිසි උද්යෝගයකින් කටයුතු කරන්නෙක් විසින් තමන් සතු භාණ්ඩ වලට දක්වන සැලකිල්ලට සමාන ආකාරයේ සැලකිල්ලක් කුලී සින්නක්කර ගිවිසුමෙහි විෂය වස්තුව වන භාණ්ඩය වෙත දැක්වීමට කුලී ගැනුම්කරු බැඳී සිටියි.

◘ කුලී සින්නක්කර හිමියාට වංචාවක් සිදු නොකිරීම.

භාණ්ඩ වංචනිකව බැහැර කිරීමෙන්, ඉවත් කිරීමෙන් හෝ වෙනත් ආකාරයකින් කුලී ගැනුම්කරු විසින් කුලී සින්නක්කර හිමියාට වංචාවක් සිදු නොකල යුතුය.

**<u>කුලී සින්නක්කර ගැනුම්කරුගේ අයිතිවාසිකම්</u>**

■ කුලී සින්නක්කර මිලෙහි අයවිය යුතු ශේෂය ප්‍රතිදානයක් සමග ගෙවීමෙන් යම් අවස්ථාවක භාණ්ඩය මිලදී ගැනීම.

■ යම් අවස්ථාවක කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීම.

■ කුලී සින්නක්කර ගිවිසුම් දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් එකම අයිතිකරුවෙකුට ඔබින ගෙවීම් සිදුකිරීම.

එකම කුලී සින්නක්කර හිමියෙකුට ( අයිතිකරුවෙකුට ) කුලී සින්නක්කර ගිවිසුම් දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් ගෙවීම් සිදුකිරීමට ඇත්නම්, එම ගිවිසුම් දෙකම යටතේ සිදුකරන ඔබින ගෙවීම්, එකම ගිවිසුමක් යටතේ සිදුකිරීමට කුලී සින්නක්කර ගැනුම්කරුට අයිතියක් ඇත.

■ කුලී සින්නක්කර ගිවිසුම යටතේ තමාගේ අයිතිවාසිකම් සහ වගකීම් වෙනත් පාර්ශවයකට පවරා දීම.

■ කුලී සින්නක්කර හිමියා භාණ්ඩයක් නැවත සන්තකයට ලබාගෙන එය විකුණන විට, කුලී සින්නක්කර හිමියා ඔහුට අයවිය යුතු මුදල පියවා ගැනීමෙන් පසුව යම් මුදලක් ඉතිරිවී ඇත්නම් එය ලබා ගැනීමට කුලී සින්නක්කර ගැනුම්කරුට අයිතිකරුට ඇත.

**<u>කුලී සින්නක්කර අයිතිකරුගේ වගකීම්</u>**

◘ කුලී සින්නක්කර ගිවිසුමෙහි පිටපත් සහ තොරතුරු සැපයීම.

කුලී සින්නක්කර ගිවිසුමෙහි සත්‍ය පිටපතක් කුලී සින්නක්කර ගැනුම්කරු වෙතත්, ඇප ගිවිසුමක් තිබේ නම් එහි සත්‍ය පිටපතක් ඇපකරු වෙතත් ගාස්තු රහිතව සැපයීම කුලී සින්නක්කර හිමියාගේ වගකීමකි.

◘ කුලී ගැනුම්කරු විසින් ඉල්ලා සිටි විට කුලී සින්නක්කර ගනුදෙනුවට අදාල තොරතුරු කුලී ගැනුම්කරු වෙත සැපයීම.



JMC vLearning "your virtual learning partner"

## කුලී සින්නක්කර හිමියාගේ අයිතිවාසිකම්

■ කුලී සින්නක්කර ගැනුම්කරු විසින් වාරික ගෙවීම පැහැර හැරි විට හෝ කුලී සින්නක්කර ගිවිසුම කඩ කල විට , එම කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමේ අයිතිය.

■ එසේ ගිවිසුම අවසන් කර ඇති අවස්ථාවකදී කුලී සින්නක්කර ගැනුම්කරු විසින් තමා වෙත ගෙවා ඇති වාරික සහ මූලික තැන්පතුව රඳවා ගැනීමට සහ අයවිය යුතු හිඟ කුලී ඇත්නම් එය අය කර ගැනීමේ අයිතිය

■ එසේ ගිවිසුම අවසන් කර ඇති අවස්ථාවකදී පනතේ විධිවිධාන සහ සීමා කිරීම් වලට යටත්ව, අදාල ගිවිසුමට විෂය වස්තුව වූ භාණ්ඩ වල සන්තකය නැවත තමා වෙත ලබා ගැනීමේ අයිතිය.

■ එසේ ගිවිසුම අවසන් කර ඇති අවස්ථාවකදී තමාට දැරීමට සිදුව ඇති යම් පාඩුවක් සඳහා කුලී ගැනුම්කරු වෙතින් අලාභ ඉල්ලා සිටීමේ අයිතිය.

■ කුලී සින්නක්කර ගිවිසුම යටතේ තමාගේ අයිතිවාසිනම් සහ බැඳීම් වෙනත් පාර්ශවයකට පවරා දීමේ අයිතිය.

## කල්බදු

කල්බදු සංකල්පයේදී සිදුවන්නේ යම්කිසි වත්කමක අයිතිය මගින් නොව එහි භාවිතය මගින් ප්‍රතිලාභ ලබා ගැනීමයි. මෙය වර්තමාන ව්‍යාපාරික ලෝකය තුල වඩාත් බහුල වශයෙන් භාවිතා වන මුදල් ණයට දීමේ බාහිර ක්‍රමයකි.

මෙරට තුල කල්බදු ගිවිසුම් පාලනය වන්නේ 2000 අංක 56 දරණ කල්බදු මූල්‍යකරණ පනත සහ එහි සංශෝධනයන් මගිනි.

කල්බදු මූල්‍යකරණයකදී සිදුවන්නේ බදු දීමනාකරුගේ වත්කමක්, නිශ්චිත කාලයකට, නියමිත වාරික ගෙවීමෙන් බදු ගැනුම්කරුට පාවිච්චි කිරීම සඳහා අවස්ථාව සැලසෙන ආකාරයේ බදු ගිවිසුමක් බදු දීමනාකරු සහ බදු ගැනුම්කරු අතර ඇති වීමයි.මෙහිදී ප්‍රතිලාභ උපයා ගනු ලබන්නේ අදාල දේපල පාවිච්චි කිරීමෙන් මිස එහි අයිතිය බදු දීමනාකරු වෙතින් බදු ගැනුම්කරු වෙත හුවමාරු වීමෙන් නොවේ.

## කල්බදු මූල්‍යකරණ පනත ප්‍රකාරව කල්බදු මූල්‍යකරණයක් යනු

- බදු ගැනුම්කරු දක්වන බදු දීමනාකරු හෝ බදු ගැනුම්කරු තෝරා ගත් සැපයුම් -කරුවෙකු සපයන උපකරණයක්, ගිවිසුමේ දින සිට අවුරුද්දකට නොඅඩු මූලික කාලයකට බදු ගැනුම්කරු සන්තකයේ හෝ පාවිච්චියට දීම සඳහා

- භාණ්ඩයේ සම්ප්‍රේෂණ මිල හෝ ඉන් ප්‍රමාණවත් කොටසක් හිලව් කිරීම පිළිබඳව විශේෂයෙන් සලකා ගණන් බලා භාණ්ඩ සන්තකය සහ පාවිච්චිය සඳහා බදු ගැනුම්

- කරු බදු දීමනාකරුට ගෙවීම සඳහා

- බදු ගැනුම්කරු විසින් උපකරණය භාරගැනීමෙන් පසුව ඉහත සඳහන් ආරම්භක කාල පරිඡෙඡ්දය තුලදී බදු ගැනුම්කරු විසින් අවසන් කරනු ලැබිය නොහැකි සහ

- ඉහත සඳහන් ආරම්භක කාල පරිච්ඡේදය දීර්ඝ කිරීම හෝ නොකිරීම සඳහා

බදු දීමනාකරු සහ බදු ගැනුම්කරු අතර ඇතිවූ ගිවිසුමක් වශයෙනි.

**<u>කල්බදු ගිවිසුමක පාර්ශවකරුවන්</u>**

බදු දීමනාකරු ⇨ කල්බද්ද යටතේ උපකරණයක සන්තකයේ සහ භාවිතයේ අයිතිය බදු ගැනුම්කරුවෙකු වෙත පවරන තැනැත්තා

බදු ගැනුම්කරු ⇨ කල්බද්ද යටතේ උපකරණයක සන්තකයේ සහ භාවිතයේ අයිතිය අත්පත් කරගනු ලබන තැනැත්තා

සැපයුම්කරු ⇨ කල්බදු මූල්‍යකරණයක කාර්යය සඳහා උපකරණයක් සපයන තැනැත්තෙකි. නමුත් එවැනි උපකරණයක් බදු ගැනුම්කරු විසින්ම සපයන අවස්ථාවක , එම බදු ගැනුම්කරුවෙකු සැපයුම්කරු යන අර්ථයට අයත් නොවේ.

**සැපයුම්කරු ≠ බදු ගැනුම්කරු**

**නමුත්, සැපයුම්කරු = බදු දීමනාකරු විය හැකිය.**

**<u>කල්බදු ගිවිසුමක උපකරණ</u>**

මීට අයත් වන්නේ ආර්ථික වශයෙන් වසර එකකට වඩා පලදායී ජීවිත කාලයක් ඇති යම් ස්පෘශ්‍ය වත්කමකි. ඉඩම් මීට අයත් නොවේ. මෙය කල්බදු වත්කම ලෙසද හඳුන්වයි.

උපකරණ වල හෝ බදු ගන්නා ලද වත්කම වල නිරවුල සහ සාමකාමී භුක්තිය ලැබීමේ අයිතිවාසිකමක් බදු ගැනුම්කරුට ඇත.

නමුත්, බදු ගැනුම්කරුගේ යම් ක්‍රියාවක් හෝ පැහැරහැරීමක් හේතුවෙන් මෙම අයිතිවාසිකම ලැබීමට ඇති අවස්ථාව ඔහුට අහිමි වී ඇති අවස්ථාවකදී මෙම අයිතිවාසිකම බදු ගැනුම්කරුට නැත.

JMC vLearning "your virtual learning partner"

**<u>බදු ගන්නා ලද වත්කම් භාර නොදීම.</u>**

කල්බදු මූල්‍යකරණයක සඳහන් උපකරණයක්, එය භාර දීම සඳහා ඒ කල්බද්ද යටතේ වූ නියම කර ඇති වේලාවේ දී හෝ ඊට පෙර බදු ගැනුම්කරුවෙකු වෙත භාර නොදී ඇත්තාවූ හෝ ඒ වේලාවෙන් පසු භාරදී ඇත්තාවූ අවස්ථාවක ( එනම්,සැපයුම් ගිවිසුමේ සඳහන් නියමයන්ට අනුව බදු ගන්නා ලද වත්කම බදු ගැනුම්කරු වෙත භාරදී නොමැති අවස්ථාවක ) එම වත්කම් ප්‍රතික්ෂේප කොට එම **<u>බද්ද අවසන් කිරීමට බදු ගැනුම්කරුට අයිතියක් ඇත.</u>**

එවන් අවස්ථාවකදී පහත සඳහන් කරුණු සඳහා බදු ගැනුම්කරුට හිමිකම පවතී.

- කල්බදු මූල්‍යකරණය යටතේ ඔහු විසින් බදු දීමනාකරුට කල යුතු යම් ගෙවීමක් අත්හිටිවීමේ අයිතිය.

- පහත සඳහන් වන ගෙවීම් අඩු කිරීමෙන් පසුව, කල්බදු මූල්‍යකරණයට අදාලව බදු දීමනාකරු විසින් රඳවා ගෙන ඇති යම් මුදලක් බදු දීමනාකරුගෙන් ආපසු අය කර ගැනීමට

  I. කල් බද්ද අවසන් කිරීමට පෙර බදු ගැනුම්කරු විසින් ලබා ගත් ප්‍රතිලාභ

  II. කල් බද්ද සම්බන්ධයෙන් බදු දීමනාකරු විසින් දරණ ලද වියදම්

  III. බදු ගැනුම්කරුගේ නොසලකා හැරීමක් නිසා හෝ පැහැර හැරීමක් නිසා වන උපකරණයේ ( කල්බදු වත්කමෙහි ) වටිනාකමේ යම් හීනවීමක්.

**<u>කල්බදු වත්කම / උපකරණ භාරගැනීම</u>**

✧✧✧ එහෙත් කල්බදු මූල්‍යකරණයක සඳහන් උපකරණයක්, එය භාර දීම සඳහා නියමිත කාල සීමාව ඇතුලත භාරදී නොමැති බව හෝ ඒ කාලයෙන් පසුව භාර දී ඇති බව හෝ ඒ උපකරණයට අදාල සැපයුම් ගිවිසුමේ ඇති නියම , කොන්දේසි, ප්‍රතිඥාභාර හෝ පිරිවිතර වලට අනුකූල නොවන බව හෝ නොතකා, බදු ගැනුම්කරු විසින් ඒ උපකරණය භාර ගෙන ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඉන් පසුව,එම කල්බදු උපකරණය ( කල්බදු වත්කම ) ප්‍රතික්ෂේප කිරීම හෝ බද්ද අවසාන කිරීමේ අයිතිය බදු ගැනුම්කරුට නොමැත. ✧✧✧

⌑⌑⌑ එනම්, බදු ගැනුම්කරු විසින් කල්බදු මූල්‍යකරණයක් යටතේ කල්බදු වත්කම භාරගත් විට කල්බද්දේ සඳහන් නියමයන් සහ කොන්දේසි වෙනස් කල නොහැක. එවැනි අවස්ථාවකදී සියලුම නියම සහ කොන්දේසි පිලිපැදීම බදු ගැනුම්කරුගේ කාර්යය වේ. ⌑⌑⌑

**<u>කල්බදු වත්කම / උපකරණ ආපසු භාර දීම</u>**

කල්බදු මූල්‍යකරණයක් කාලය ඉකුත්වීම මත හෝ කලින් අවසන් වීම සිදුවූ විට, බදු දීමනාකරු වෙත කල්බදු මූල්‍යකරණය ආරම්භයේදී බදු ගැනුම්කරු වෙත එය භාර දුන් අවස්ථාවේ පැවති තත්වයෙන්ම කලුබදු උපකරණ / කල්බදු වත්කම් බදු දීමනාකරුට ආපසු

භාර දිය යුතුය. එහෙත් එම උපකරණ කල්බදු ගැනුම්කරු විසින් භාවිතා කිරීමේදී සාධාරණ ගෙවීයාම් සහ පාර්ශවයන් විසින් එකඟ වන යම් වෙනස් කිරීම් පිලිගනු ලැබේ.

**<u>කල්බදු ගිවිසුම ඉටු කිරීම පැහැර හැරීම සහ ඊට ඇති පිලියම්</u>**

**<u>බදු ගැනුම්කරු විසින් කරන ලබන පැහැර හැරීම්</u>**

කල්බදු ගිවිසුමෙහි නියම සහ කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමට බදු ගැනුම්කරු අපොහොසත් වූ විට හෝ පැහැර හැර ඇති විට, එම පැහැර හැරීම සැලකිය යුතු පැහැර හැරීමක් ලෙස සැලකේ.

උදාහරණ - කල්බදු ගිවිසුමේ සඳහන් ආකාරයට නිසි පරිදි කල්බදු වාරිකය ගෙවීමට බදු ගැනුම්කරු පැහැර හැරීම හෝ අපොහොසත් වීම.

**<u>බදු ගැනුම්කරු විසින් කරන ලබන පැහැර හැරීමකදී බදු දීමනාකරුට ඇති පිලියම්</u>**

♦ කල්බදු ගිවිසුම යටතේ බදු ගැනුම්කරු විසින් කරන ලද පැහැර හැරීම කඩිනමින් යථා තත්වයට පත් කරන ලෙස ( උදා - කල් බදු ගිවිසුම යටතේ අය විය යුතු හිඟ මුදල් කඩිනමින් ගෙවන ලෙස ආදී වශයෙන් ) බදු ගැනුම්කරුට නියම කිරීම.

♦ එම යථා තත්වයට පත් කිරීම කඩිනමින් කිරීමට ( උදා - හිඟ කල් බදු වාරිකය කඩිනමින් ගෙවීම. ) බදු ගැනුම්කරු අපොහොසත් වන අවස්ථාවකදී එම කල්බදු මූල්‍යකරණ ගිවිසුම අවසන් කිරීමට බදු දීමනාකරුට නීතිය ප්‍රකාරව අයිතිවාසිකම් ඇති අතර එවිට .,

- කල්බදු උපකරණ වල සන්තකය ආපසු ලබා ගැනීමට සහ
- බදු ගැනුම්කරු විසින් කල්බදු ගිවිසුම කඩ නොකර සිටියානම්, බදු දීමනාකරු පත්විය හැකිව තිබූ තත්වයකට බදු දීමනාකරු පත් කිරීමට අවශ්‍ය අලාභ, වන්දියක් ආකාරයෙන් අය කරගනු ලැබිය හැකිය.

✧ එහෙත් ඉහත සඳහන් පියවර අනුගමනය කිරීමට පෙර බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් භාර දිය යුතුය. ✧

**<u>බදු ගැනුම්කරු විසින් කරන ලබන පැහැර හැරීමකදී බදු දීමනාකරු විසින් කල්බදු වත්කම්වල සන්තකය ආපසු ලබා ගැනීම.</u>**

**1. අධිකරණ නියෝගයක් නොමැතිව ආපසු ලබා ගැනීම**

මෙම පිළියම ක්‍රියාත්මක කිරීමට පෙර බදු දීමනාකරු අනුගමනය

කළ යුතු පියවර කීපයක් ඇති අතර, ඒවා පහත පරිදි වේ.

1. එම කඩ කිරීම පිළිබඳව සහ වත්කමේ සන්තකය අපසු ලබා ගැනීමට ඇති බදු දීමනාකරුගේ අපේක්ෂාව පිළිබඳව පොලිසියට දැනුම් දීම.
2. ආපසු ලබා ගැනීම ක්‍රියාත්මක කිරීමේදී සාමය කඩකරීමක් වළක්වා ගැනීම සඳහා පොලිසියෙන් සහාය ලබා ගැනීම.
3. කිසිදු ප්‍රතිවිරෝධ පෑමක් නොමැතිව ලබාගත හැකිනම් වත්කමේ සන්තකය ආපසු ලබා ගැනීම ( හැකිනම් සාමකාමීව වත්කමේ සන්තකය ආපසු ලබා ගැනීම )

**2. අධිකරණ නියෝගයක් මගින් ආපසු ලබා ගැනීම**

ඉහත සඳහන් කර ඇති පරිදි වත්කමේ සන්තකය ආපසු ලබා ගැනීමට බදු දීමනාකරුට නොහැකි වී නම්, බදු දීමනාකරුට දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කර වත්කම්වල සන්තකය ලබා ගැනීම සඳහා අධිකරණය නියෝගයක් ලබාගත හැකිය.

**කල්බදු ක්‍රමයේ වාසි**

**බදු දීමනාකරුට ඇති වාසි**

☒ පොලිය අය කර ගත හැකි වීම

☒ මූල්‍ය අවදානම අඩු වීම ( අදාල දේපලේ පරම අයිතිය තවදුරටත් බදු දීමනාකරු සතු වන බැවිනි )

☒ කල්බදු ගිවිසුම උල්ලංගනයකදී භාණ්ඩ වල සන්තකය නැවත ලබා ගැනීම පහසු වීම

☒ නිශ්චිත කාලසීමාව ආරම්භයේ සිටම ණය වාරික ගෙවීම ආරම්භ වේ.

☒ නිශ්චිත කාලසීමාව අවසානයේදී කල්බදු ගිවිසුමට අදාල දේපලේ හුවමාරු ගාස්තු බදු ගැනුම්කරු වෙත ලැබෙන අතිරේක ආදායමකි.

**බදු ගැනුම්කරුට ඇති වාසි**

☒ තම ප්‍රාග්ධනය වෙනත් අවශ්‍යතා සඳහා යොදා ගත හැකි වීම

☒ ඉතා පහසුවෙන් කල්බදු පහසුකමක් ලබා ගත හැකි වීම.

## කුලී සින්නක්කර හා කල්බදු ගිවිසුම් අතර ඇති වෙනස් කම්

| | කල්බදු ගිවිසුම් | කුලී සින්නක්කර ගිවිසුම් |
|---|---|---|
| දේපලේ හිමිකාරීත්වය | බදු දීමනාකරු සතුවේ. | මිලදී ගැනීමේ අභිමතය කුලී ගැනුම්කරු සතුය. |
| වාරික ගෙවීම / වාරිකයේ වටිනාකම | දේපල පාවිච්චි කිරීමට හිලව් පිණිස වාරිකයේ වටිනාකම තීරණය වේ. | වාරිකය තුල භාණ්ඩයේ වටිනාකමින් කොටසක් සහ පොලිය ද අන්තර්ගතය. |
| කාලසීමාව | අවම කාලසීමාව වසරකි. | එසේ නොවේ. |
| දේපල නඩත්තුව හා අලුත්වැඩියා කිරීමේ වගකීම | මෙහෙයුම් කල්බද්ද හැරුණ විට සෙසු කල්බදු සඳහා නඩත්තු අලුත්වැඩියා වගකීම ඇත්තේ බදු ගැනුම්කරු වෙතය. | කුලී ගැනුම්කරු වෙත ඇත. |
| ක්ෂය වීම | ක්ෂය වීම්, කල්බදු දීමනාකරුගේ ගිණුම්පොත් හි වියදමක් ලෙස සටහන් වේ. | ක්ෂය වියදම් කුලී ගැනුම්කරු වෙත පවතී |
| ප්‍රධාන ව්‍යවස්ථාපිත නීතිය | 2000 අංක 56 දරණ කල්බදු මූල්‍යකරණ පනත | 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනත |

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්ණ

1) කුමාර විසින් තම යතුරු පැදිය සඳහා සම්පූර්ණ රක්ෂණාවරණයක් ලබාගනී. රක්ෂණාවරණය කල් ඉකුත් වීමට පෙර ඔහු එම යතුරු පැදිය අමල්ට විකුණයි. එසේ මිලදී ගත් යතුරු පැදිය වෙනුවෙන් අමල් කිසිඳු රක්ෂණාවරණයක් අලුතෙන් ලබා නොගනී. මේ සම්බන්ධයෙන් නිවැරදි නෛතික තත්වය දැක්වෙන පිලිතුර පහත පිලිතුරු අතරින් තෝරන්න.

අ) කුමාර විසින් එම යතුරු පැදිය සඳහා ලබා ගෙන ඇති රක්ෂණාවරණයේ ආවරණ කාලය අතරතුර අමල් විසින් එය පාවිච්චි කිරීමේදී යම් අනතුරක් සිදු වුවහොත් ඒ සඳහා ඉහත රක්ෂණාවරණය ප්‍රකාරව රක්ෂණ වන්දි ලබාගැනීමේ අයිතියක් කුමාරට ඇත.

ආ) ඉහත ( අ ) හි සඳහන් අයිතිය ඇත්තේ කුමාරට නොව අමල්ටය.

ඇ) ඉහත ( අ ) හි සඳහන් අයිතිය ඇත්තේ අමල් සහ කුමාර යන දෙදෙනාටමය.

ඈ) ඉහත ( අ ) හි සඳහන් අයිතියක් කිසිවෙකුටත් නැත.

2) රක්ෂණය සම්බන්ධයෙන් මෙරටදී අදාල වන නීතිය වන්නේ

අ) ඉංග්‍රීසි නීතිය

ආ) රෝම ලන්දේසි නීතිය

ඇ) ඉහත නීති සාම්ප්‍රදායන් දෙකම

ඈ) ඉහත කිසිත් නොවේ.

3) හානිපූර්ණ මූලධර්මය අදාල නොවන රක්ෂණ වර්ගයක් වනුයේ

අ) ජීවිත රක්ෂණය

ආ) රථවාහන රක්ෂණය

ඇ) ගිනි හානි රක්ෂණය

ඈ) ස්වභාවික උවදුරු රක්ෂණය

4) සැබෑ වටිනාකම රුපියල් කෝටියක් වන දේපලක් රුපියල් හැට ලක්ෂයක රක්ෂණ වටිනාකමකට රක්ෂණය කර ඇති විටඑම දේපල මුලුමනින්ම විනාශ වුවහොත් එකී රක්ෂණාවරණය යටතේ හිමිවන රක්ෂණ වන්දි මුදල වන්නේ රුපියල්

අ) ලක්ෂ හැටයි

ආ) ලක්ෂ සියයයි

ඇ) ලක්ෂ තිහයි

ඈ) නිවැරදි පිලිතුර දී නැත.

5) ඉහත ( 4 ) ප්‍රශ්ණයට අදාල දේපලෙහි හරි අර්ධයක් පමණක් විනාශ වුවහොත් එකී රක්ෂණාවරණය යටතේ හිමිවන රක්ෂණ වන්දි මුදල වන්නේ රුපියල්

අ) ලක්ෂ හැටයි

ආ) ලක්ෂ සියයයි

ඇ) ලක්ෂ තිහයි

ඈ) නිවැරදි පිලිතුර දී නැත.

JMC vLearning "your virtual learning partner"